කොලොන්න ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------
1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 05 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------
1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
ii. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඇතුළත් සටහන්.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාල ලැබිය යුතු උසාවි දඩ ආදායම් තුල වැඩිපුර ගිණුම්ගතව තිබූ රු. 158,383 ක මුදල සමුච්චිත අරමුදල මඟින් කපාහැරීම වෙනුවට එම ගිණුමේ සම්පූර්ණ ශේෂය වූ රු. 1,152,552 ක් සමාලෝචිත වර්ෂය තුලදී සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැරීම හේතුවෙන් වර්ෂ අවසානයේ ජංගම වත්කම් රු. 994,169 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුද්දර ගාස්තු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් බිල්කල මුද්දර ගාස්තු ආදායම රු. 899,680 ක් වුවද, 2013 වර්ෂයේ ඇස්තමේන්තු කල රු. 2,500,000 ක මුළු මුදලම වර්ෂයේ ආදායම් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 1,600,320 කින් අඩුවී තිබුණි.

(ඇ) මුද්දර ගාස්තු ලෙජර් ගිණුමේ ආරම්භක ශේෂය රු. 1,004,451 ක මුදල හා වර්ෂය තුල මුද්දර ගාස්තු ලැබීම් රු. 3,149,775 අතර වෙනස වූ රු. 2,145,324 ක් සමාලෝචිත වර්ෂය තුලදී හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට එරෙහිව ලියාහැර තිබුණි.

(ඇ) ආදායම් ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය තුල සභාව සතු වාහන කුළියට දීමෙන් ලත් ආදායම රු. 329,625 ක් වුවද, අවසාන ගිණුම් වල 3-25 ආදායම් ශීර්ෂය තුල එකී ආදායම රු. 300,400 ක් ලෙස දැක්වීම තුල රු. 29,225 ක ආදායමක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන්ට අදාල රු. 54,230 ක බැඳීම්, 2013 වර්ෂයේ ණයහිමියන්ට ඇතුලත් කර නොතිබීමේ හේතුවෙන් වර්ෂාවසාන ණයහිමි ශේෂය එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) අක්කර බදු, වෙනත් ආදායම් හා ජල ගාස්තු ලෙජර් ගිණුම් වල පැවති ශේෂයන් හා ඊට අදාල ලේඛණයන්හි පැවති ශේෂයන් අතර රු. 27,552 ක් වූ වෙනසක් හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදල මඟින් ගලපා තිබුණි.

(උ) වැය ලේඛණය අනුව ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 366,394 ක වියදමක් දරා තිබුණි. එම අගය ගබඩා ලෙජර් ගිණුම මඟින් පාවිච්චි කරන ලද ද්‍රව්‍ය, වියදම් කල වැය ශීර්ෂ අනුව හර කල යුතු වුවද, වියදම් ඍජුවම වැය ශීර්ෂ වලට හර කර තිබුණි. ඒ අනුව මෙම ගිණුම්කරණ දෝෂය හේතුවෙන් පොදු ගබඩා (පරිභෝජන ද්‍රව්‍ය) ගිණුම තුලින් සාවද්‍ය ශේෂයක් නිරූපණය වී තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂයන්ගේ එකතුව රු. 6,393,322 ක්වූ අතර, උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 5,799,594 ක් වූයෙන් වෙනස රු. 593,728 ක් විය. තවද, වැය විෂයයන් 02 කට අදාලව වැය ලෙජරය හා ප්‍රධාන ලෙජරයේ කේවල ගිණුම් අතර රු. 250,558 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

එකතුව රු. 14,018,959 ක් වටිනාකමැති ගණුදෙණු අවස්ථා 04 ක් සම්බන්ධයෙන් අවශ්‍ය වූ ලිඛිත සාක්ෂි නොමැති වීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------- |
| | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u> | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371(2) | එකතුව රු. 87,010 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වනවිටද පියවා නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 571 | 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාලව රු. 381,778 ක තැන්පතු රාජ්‍ය ආදායමට නොගෙන දිගින් දිගටම රඳවාගෙන තිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි අංක 1645 | වාහන 07 ක දෛනික ධාවන සටහන් පිළියෙල කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,678,397 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයහාරය රු. 2,234,240 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 17 | 6 | 11 |
| බදු කුලී | 2,833 | 2,641 | 192 |
| බලපත්‍ර ගාස්තු | 715 | 268 | 447 |
| වෙනත් ආදායම් | 6,030 | 3,597 | 2,433 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුද්දර ගාස්තු ආදායම් ලෙස 2010 සැප්තැම්බර් මස සිට 2013 මාර්තු මස දක්වා කාල සීමාවට ඉඩම් රෙජිස්ට්‍රාර් මඟින් ලැබිය යුතු රු. 61,800 ක මුදලක් විගණිත දිනය වූ 2014 අප්‍රේල් 09 දින වනවිටද හිඟව පැවතින.

(ආ) ඇඹිලිපිටිය දිසා අධිකරණය මඟින් උසාවි දඩ ආදායම් ලෙස ලැබිය යුතු මුදල් 2013 ජූලි මාසයෙන් පසු සභාවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බදු කුලී

---------

කඩකාමර 31 කට අදාලව බිම්බදු සඳහා ගිවිසුම් වලට එළඹ නොතිබූ අතර, ඉන් කඩකාමර 16 කින් අයවිය යුතු මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු වලට අදාල අයවීම් වල හිඟහිටි අවස්ථා 63 ක් සඳහා රු. 360,125 ක හිඟයක් පැවතියද, ආදායම් අයකර ගැනීම උදෙසා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.2.5 ව්‍යාපාර බදු

---------------

ව්‍යාපාර බදු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණ විගණිත දිනය වූ 2014 අප්‍රේල් 08 දින වනවිටද සිදුකර නොතිබූ අතර ආයතනයට එකතුවන ආදායම් පමණක් පදනම් කරගෙන ආදායම් ලේඛණ පවත්වා තිබුණි

2.2.6 වෙනත් ආදායම්

-------------------

කොලොන්න ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් 108 දෙනෙකු වෙතින් රු. 70,734 ක හිඟ මුදලක් 2013 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතුව සුසාන භූමි 38 ක් පවතින අතර, එයින් 15 ක මැනුම් කටයුතු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර තිබුණද, ඉතිරි සුසාන භූමි 23 හි මැනීම් කටයුතු සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 1960 වර්ෂයේ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රදේශයේ මාර්ග 36 ක් නම් කිරීමෙන් පසු මාර්ග 02 ක් සභාව වෙත පවරා ගැනීම හැර මෙම ප්‍රදේශයේ අළුතින් සංවර්ධනය වූ මාර්ග හඳුනා ගෙන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී රු. 100,000 ක වටිනාකමින් යුත් ජෙනරේටර් මිලදී ගෙන ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන 07 ක් වෙත බෙදා දී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර ජෙනරේටර ඉන්වෙන්ට්‍රිගත කර නිකුත් කිරීම් නියෝග මඟින් අදාල සංවිධාන වෙත භාර දී නොතිබුණි. ස්වේච්ඡා සංවිධාන විසින් විධිමත්ව භාණ්ඩ භාරගත් බවට අත්සන් ලේඛණයක්ද නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය පරිපාලන) රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වැය ශීර්ෂ 22 කට සලසා තිබූ රු. 8,590,000 ක ප්‍රතිපාදන කිසිදු වියදමක් නොදරා ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 23 කට අදාලව වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් රු. 39,414,831 ක් ඉතිරි වී තිබූ අතර, වැය ශීර්ෂ 16 කට අදාලව වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා රු. 1,402,295 ක් වියදම් දරා තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) අයවැය පාලනය

(iii) ආදායම් පරිපාලනය